# උපදේශ ශතකය

## ද්විතීය තරංගය

පැරණි උපදේශ පද්‍ය එකතුවකි

ග. ආරියපාල ගුණසේන



# උපදෙශ ශතකය
## ද්විතිය තරංශය
## 2

ශ. ආරියපාල ගුණසේන
විසින්

ප්‍රකාශය :
මොඩන් පොත් සමාගම
නුගේගොඩ

# උපදේශ ග්‍රන්ථය

## දෙවැනි තරඞ්ගය

## 2

### සිරිගණ නමදිම්

1 අපි මෙරූපමං ප්‍රාඥ
මපි ශූරමපි ස්ථිරම්
තෘණීකරොති තෘෂ්ණෛකා
නිමෙෂෙණ නරොත්තමම්

(ශාර්ංගධර පද්ධති)

**මහ මෙරවන් මහ නුවණැත්තකු වුවත් එක ම තෘෂ්ණාවගේ හේතුවෙන් ලඝුතාවයට පත්වන බවට උක්තියෙකි.**

1 සුනෙරවන් නුවණැති
සුරු විරු තිර සිතැත්තෙ ද
තණ්හා විසින් තණරොඩු
ලෙස සෙද ලුහු බවට යේ

(ගී විරිත)

---

1 සුනෙරවන් – මහාමෙරු පර්වතය වැනි වූ, සුරු විරු – ශූර හා විරවත්, තණ්හා විසින් – තෘෂ්ණාව කරණකොට ගෙන, සෙද–වහා.

2 තෙනාධිතං ශ්‍රුතං තෙන
තෙන සර්වමනුෂ්ඨිතම්
යෙ නාශාං පෘෂ්ඨතඃ කෘත්වා
නෛරාශ්‍ය මවලම්බිතම්

(කුවලයානන්ද)

3 ගිරිර් මහාන් ගිරෙරබ්ධිර්
මහානබ්ධෙර් නභො මහත්
නභසෝ'පි මහද්බ්‍රහ්ම
තතොප්‍යාශා ගරීයසී

(කුවලයානන්ද)

4 ආශෛව රාක්ෂසී පුංසා–
මාශෛව විෂ මඤ්ජරි
ආශෛව ජීර්ණ මදිරා
ධිගාශා සර්වදෙෂ භූඃ

(කුවලයානන්ද)

5 යෞවනං ජරයා ග්‍රස්ත–
මාරෝග්‍යං ව්‍යාධි භිර්හතම්
ජීවිතං මෘත්‍යුරභ්‍යෙති
තෘෂ්ණෛකා නිරුපද්‍රවා

(සුභාෂිතාවලි)

---

2 ආසාව පිටුදක – ඇල්ම දුරුකොට, උගතැසු – උගෙනගත් දෑ හා ඇසූ දෑ.

3 ගිර – පර්වතය, අඹර – අහස, බඹ – බ්‍රහ්මය.

**තෘෂ්ණාව තුනී කළ මනසෙහි ඇසූ දෑ උගත් දෑ අමතක නොවී පවත්නා බවෙකි.**

2 ආසාව පිටු දක
නිරාසායෙහි එල්බුණු
කල්හි මිනිසා උගතැ'සු
හැම ම මතකෙහි රඳනේ

(ගී විරිත)

**සකලවිධ වස්තූන්ට ම වඩා බ්‍රහ්මාණ්ඩ මහත්යැයි යෙති. එහෙත් ආශාව එයටත් වඩා මහත්යැයි කියනු ලැබේ.**

3 ගිර සමුද්‍ර අඹර
බඹ මෙහැම එකිනෙකකට
වැඩියෙන් මහත්වන මුත්
ආසාව බඹටත් වැඩි

(ගී විරිත)

**හැම විෂයන් ම මුළුදෙන විෂ පොකුරක් සේ දක්නා තණ්හාවට මෙසේ නින්ද කෙරෙසි.**

4 තණ්හා නරනට කුරිරු රකුසිය ක
හැමවිස එක්තැන් වූන විස පොකුරෙ ක
තෙමේ ම දිරවන විසම සුරාවෙ ක
නින්දයි ! ආසාවට දෙස ඇති නෙ ක

(පෙද විරිත)

**මිනිසා මියගියත් තෘෂ්ණාව නොමියෙන බව කියයි.**

5 තුරුණු ගතිය ඉවරයි ගත දිරුමෙ න
නිරොව හමාරයි රෝ බැළඳීමෙ න
දිවියත් ඉවරයි මරුවා ආ දී න
එනමුත් පවතියි තණ්හා නොමියෙ න

(පෙද විරිත)

6 යච්චකාම සුඛං ලොකෙ
යච්චදිව්‍යං මහත් සුඛං
තෘෂ්ණා ක්‍ෂය සුඛස්‍යෛතෙ
නාර්හතඃ ෂොඩශිංකලාම්

(මහාභාරත)

7 මනොරථ රථාරූඪං
යුක්ත මින්ද්‍රිය වාජිභිඃ
භ්‍රාම්‍යත්‍යෙවජගත් කෘත්ස්නං
තෘෂ්ණා සාරථි චොදිතම්

(සුභාෂිතාවලි)

8 ආසන්නාන් පුරතො භාවාන්
දර්ශයිත්වා පුරඃ පුරඃ
ජාගොහරිත මුෂ්ට්‍යෙව
දූරං නීතාස්මි තෘෂ්ණයා

(සූක්ති මුක්තාවලී)

9 ආශායා යෙ දසාස්තෙ
දසාඃ සර්ව ලොකස්‍ය
ආශා යෙෂාංදසී
තෙෂාං දසාය තෙ ලොකඃ

(කවිතාමෘත)

---

6 ලොවී-ලෞකික, සුගි සපුවත් – දිව්‍ය සම්පතත්, තණ පැහීමෙන්– තෘෂ්ණාව ප්‍රහීණ කිරීමෙන්, කලාවක් – සොළොසින් කොටසක්.

7 බමවයි – භ්‍රමණය කරවයි, ඉඳුරුනම් – ඉන්ද්‍රිය නැමැති.

8 තන්හා විලස්පා – තණ්හාව විලාසපාවත් පෙන්වා.

**ලෞකික සැපතෙහිත් අලෞකික සැපතෙහිත් වෙනස මෙසේ දක්වයි.**

6 ලොවී කම් සුවයත්
සුගී සපුවත් තණ පැහිමෙන්
ලද ලොව්තුරු සුවෙහි
කලාවක් පමණකුදු නො අගී

(ගී විරිත)

**තණ්හාව විසින් සත්වයා ලෝකය වටා භ්‍රමණය කරවනු ලැබේ**

7 තණ්හා රියැදුරා
ඉඳුරු නම් තුරඟුන් යෙදූ
මනස් නම් රියැ නැඟැගෙන
බමවයි මුළුලෝ වටා

(ගී විරිත)

**තණ්හා නමැති සුන්දරාව පානා විලාසිතායෙන් මෝහිතවූයේ අමාර්ග ප්‍රතිපන්න වන බව පැවැසේ.**

8 කොළඹිට පෙරට පා
දුර ගෙන යනුසෙ එළුවා
තණ්හා විලස් පා මා
දුරු තැනකට ගෙනගියා

(ගි විරිත)

**තමා තෘෂ්ණාවට නතුවීම හා තමා විසින් තෘෂ්ණාව යටත් කැර ගනු ලැබීම ගැන උක්තියෙකි.**

9 දස වුවොත් කිසිවකු ආසාව ට
දස බවට යෙයි මේ මුළු ලෝකෙ ට
තමන් දස කර ගතහොත් ආසා
මුළුලොව තම්හට වනු ඇත දසා

(දෙපිය විරිතෙකි)

10 ත්වාමුදර සාධු මන්‍යෙ
ශාකෛරපි යදසි ලබ්ධ පරිතොෂම්
හතහෘදයං හ්‍යධිකාධික
වාඤ්ඡාශත දුර්භරං න පුනඃ

(ශාන්තිශතක)

11 අඞ්ගං ගලිතං පලිතං මුණ්ඩං
දශන විහිනං ජාතං තුණ්ඩම්
වෘද්ධොයාති ගෘහිත්වා දණ්ඩං
තදපි න මුඤ්චත්‍යාශා පිණ්ඩම්

(ශඞ්කරාචාර්ය)

12 ආසිෂ්‍යෙ සුචිතො ගෘහීති විහිතො මොහෙන දරග්‍රහ-
ස්තත් සංගාත් සුතදස බාන්ධව සුහෘත් සම්බන්ධිනාමුද්භවඃ
තන්නිර්වාහකදර්ථිනා පරිභවා නෛචිත්‍ය චින්තාජුෂඃ
කිං සෞඛ්‍යං කතමා ගෘහස්ථිතිරතො'නර්ථො මයා
ස්වීකෘතඃ

(සුභාෂිතාවලි)

13 වපුඃ කුබ්ජීභූතං ගතිරපි තථා යෂ්ටි ශරණා
විශීර්ණා දන්තාලිඃ ශ්‍රවණ විකලං ශ්‍රොත්‍ර යුගලම්
ශිරඃ ශුක්ල චක්ෂුස් තිමිර පටලෛ රාවෘත මහො
මනොමෙ නිර්ලජ්ජං තදපි විෂයෙභ්‍යඃ ස්පෘහයති

(කවිතාමෘත)

12 දසුන් – සේවකයන්, සැබැඳෙක – සම්බන්ධයක්,

**කුස තෘප්තිමත් කළ හැක. එහෙත් සිත තෘප්තිමත් කළ නොහැකි බව පැවැසේ.**

10 කුස යෙහෙකැයි හඟිමි
පලා එකාලිනුත් තුටු වෙයි
එහෙත් හද නම් අදිකවැ
ආසා කැරෙයි නෙක දෑ

(ගී විරිත)

**කොතරම් මහලු වී ගිය ද ආශාව නම් පිටුදැකීම දුෂ්කර බව පැවැසේ.**

11 අතපය වැහැරී කෙස්ටික පැසිල යි
දත්ටික ගිලිහී ගොස් කට ලොඹුවෙ යි
වෙවුලන අතකින් ගත් සැරයටිය යි
එහෙත් ඇලුම් ඇති දෑ අත් නොහරි යි

(පෙද විරිත)

**ගිහිගෙයි නොයෙක් කම්කටොළුවලට භාජනවූවකුගේ අත්දැකීමක් විස්තර කැරෙමින් ගිහි ජීවිතයේ නිසරු බව මෙසේ දක්වයි.**

12 බාලවියැ සුවපත්වැ උන්නෙමි
තුරුණු වියැ බැඳුනෙමි විවාහෙ ක
ඒ නිසා ලත් දරු දසුන් නෑ
යහලුවන්ගේ වීය සැබැඳෙ ක
එයින් හටගත් තැවුල් දුක්
අපහාස ඈ වින්දෙමි බයාන ක
කුමන නම් සුවයෙක් ද ? ගිහිගෙයි
දනිමි ඇති බව් අවැඩ දය ක

(දඬු විරිත)

**මරණය පෙනි පෙනිත් මිනිසාගේ විෂය රසයට ඇති ලජ්ජානැති ආශාව ගැන උක්තියකි.**

13 සිරිර කුදු ගැසිලය් දත් විකාරය් විදගොස්
සැරයටි ගඹනය් දැඹස් පෙනිමත් අඩාලය්
ඉස නිකට පැසිලය් කන්ද නැසේ එසේ මුත්
විලි නැතිව ඇලෙන්නේ දූන් පවා කම් රසේමැය්

(මාලිනී විරිත)

14 සෞජන්‍යාමෘත සින්ධවඃ පරහිත ප්‍රාරබ්ධ වීරව්‍රතා
වාචාලඃ පරවර්ණනෙ නිජගුණාලාපෙච මෞනව්‍රතඃ
ආපත් ස්වප්‍ය විලුප්ත ධෛර්‍ය නිචයාඃ සම්පත්
ස්වනුත්සේකිනො
මා භූවන් බල වක්ත්‍ර නිර්ගත විෂජ්වාලාතතාඃ සජ්ජනාඃ
(ප්‍රසංගාභරණම්)

15 බලඃ සර්ෂප මාත්‍රාණි
පරච්ඡිද්‍රාණි පශ්‍යති
ආත්මනො බිල්ව මාත්‍රාණි
පශ්‍යන්නපි නපශ්‍යති
(මහාභාරත)

16 නවිනා පරවාදෙන
රමතෙ දුර්ජනො ජනඃ
කාකඃ සර්වරසාන්භුක්ත්වා
විනා මෙධ්‍යං න තෘප්‍යති
(ශාර්ංගධර පද්ධති)

17 විෂමා මලිනාත්මානො
ද්විජිහ්වා ජිහ්මගා ඉව
ජගත් ප්‍රාණ හරා නිත්‍යං
කස්‍ය නොද්වෙජකාඃ බලාඃ
(ශාර්ංගධර පද්ධති)

---

14 අමපිරි – අමෘත රසය පිරුනාවූ, දුමුව – දුෂ්ට මුඛ.

16 තිත්වනු – තෘප්තියට පැමිණීම.

17 වක් – වංක, කුටිල – වංක.

**පරහිතකාමී නියම සත්පුරුෂයනට කැරෙන ආසිරි පැතුමෙකි.**

14 සුදන අමපිරි ගෙහෙකි පරහිත නිරත ඇරැඹු විරිය පවති යි
අනුන් ගුණ වැනුමෙහිදි දෙඩමලු එහෙත් සියගුණ
වැනුමැ ගොළුවෙ යි
විපත් පත්කල ඉබොහො දිරිමති සැපෙහි
නිරහංකාර ගතිය යි
එබඳු සුදනට පතමි දුදනගෙ දුමුව විසබස් නොළං වෙවයි
(දඬුවිරිත)

**දුර්ජනයන් ස්වකීය මහා දොෂය හා මෙරමාගේ අල්ප දොෂය දක්නේ මෙන්න මේ අයුරිනි.**

15 දුදන මෙරමාගේ
අබැටෙක දෙස ද දක්නේ
බෙලිපල සා තමින් දෙස
කදහස හේ නොදක්නේ
(ගී විරිත)

**අනුන්ට ගැරහීමෙන් ම තෘප්තිමත් වන දුර්ජනයාගේ පියෙවි ගතිය මෙසේ දැක්වේ**

16 කවුඩා හැම රසක්
කැවද තිත්වනු වසුරිති
එමෙන් දුදනා පරහට
ගැරහීමෙන් ම තිත් වේ
(ගී විරිත)

**දූෂිත වූ ද කුටිල වූ ද සිත් ඇත්තෝ සර්පයන් මෙන් මිනිසාට බිය උපදවන්නෝ ය.**

17 කිළිටි වක් අදහස්
ඇත්තෝ සපුන් ලෙස දන
නසති එහෙයින් දුදනෝ
කවරුනට බිය නොදෙති ද ?
(ගී විරිත)

18 ඌර්ජිතං සජ්ජනං දෘෂ්ට්වා
ද්වෙෂ්ටි නීචඃ පුනඃ පුනඃ
කබලී කුරුතෙ ස්වස්ථං
විධුං දිවි විධුං තුදඃ

(දෘෂ්ටාන්ත ශතක)

19 උපකාරොපි නීචානාම්
අපකාරොහි ජායතෙ
පයඃ පානං භුජඞ්ගානාං
කෙවලං විෂ වර්ධනම්

(දෘෂ්ටාන්ත ශතක)

20 අයඃ පිණ්ඩ ඉවොත්තප්ත
ඛලානාං හෘදයෙ ක්ෂණාත්
පතිතා අපි නෙක්ෂන්තෙ
ගුණාස්තොය කණා ඉව

(ශාර්ංගධර පද්ධති)

21 වජ්නියො මති මතා
දුර්ජනඃ සව්‍ය වෛරයොඃ
ශ්වා භවත්‍යපකාරාය
ලිහන්නපි දශන්නපි

(ශාර්ංගධර පද්ධති)

---

18 පලහා – රාහු අසුරයා, ගිලගැණේ – ග්‍රහණය කරනු ලැබේ, වොරදන – බබලන.

20 රත්යවට – රත්කළ යකඩයට.

21 ඩැසුම – සපාකෑම.

**සමාජයේ බැබළෙන සුධීනට දුර්ජනයෝ ද්වේෂ කෙරෙති.**

18 පලහා විසින් නුබ
බබලන සඳු ගිලගැණේ
දනතර එමෙන් වොරදන
සුදනට දුදන එරෙහිය

(ගි විරිත)

**දුර්ජනයාට කරන උපකාරය විපත් පිණිස වන්නේයැයි උක්තියකි.**

19 කිරි බීමෙන් වැඩුණු
සපුහුගේ විස වැඩීවේ
එලෙසින් දුදනාට කළ
වහළ වේ අපකාරෙට

(ගි විරිත)

**දුර්ජන හෘදයට සත්පුරුෂ ධර්මයන් ඇතුළු කිරීම කළ නොහැක්කකැයි පැවැසේ.**

20 රත් යවට ලූ දිය
බිඳක් නොරඳන විලසේ
දුදනන්ගෙ හදවත ලන
ගුණ ලවයකුදු නොරැඳේ

(ගි විරිත)

**දුර්ජනයා හා මිතුරුවීමත් සතුරුවීමත් දෙකම අවැඩදායක බව් පැවැසේ.**

21 දුදනන් හා මිතුරු
සහ රිපු බවත් නොහොබී
බල්ලා ගත ලෙවීමත්
ඩැසුමත් දෙකම අවැඩ ය

(ගි විරිත)

22 ඛල: සත්ක්‍රිය මානොප
දදති කලහං සතාම්
දුග්ධ ධෞතො'පි කිං යාති
වායසඃ කලහංසතාම්

(ශාර්ංගධර පද්ධති)

23 දුර්ජනස්‍ය විශිෂ්ටත්‍වං
පරොපද්‍රව කාරණම්
ව්‍යාඝ්‍රස්‍ය චොපවාසෙන
පාරණං පශුමාරණම්

(ශාර්ංගධර පද්ධති)

24 සන්ත්‍යජ්‍ය ශුර්පවත් දොෂාන්
ගුණාන් ගෘහ්ණාති පණ්ඩිතඃ
දොෂ ග්‍රාහී ගුණත්‍යාගී
පල්ලොලිව හි දුර්ජනඃ

(ශාර්ංගධර පද්ධති)

25 අකස්මා දෙව කුප්‍යන්ති
ප්‍රසීදන්ත්‍ය නිමිත්තතඃ
ශීලමෙතදසාධූනා
මභ්‍රං පාරි ප්ලවං යථා

(ශාර්ංගධර පද්ධති)

---

22 දෙවියත් – සේදුව නමුත්, කලහස් – කාල හංසයා, යහකිස – යහපත් වැඩ,

23 වග – ව්‍යාඝ්‍රයන්ගේ.

24 කුත්සිත – දුදනා, පෙරෙණය – පෙරන උපකරනය පෙනේර යෑ යි ද යෙති.

25 ගනබෙහි – වලාකුලෙහි, නොකරුණු – හේතු රහිතවූ, සැබැවිය – සවභාවය.

**අසත්පුරුෂයා සත් වැඩකට සහභාගි වුව ද එතැන කඩාකප්පල් කාරී වන බව පැවැසේ.**

22 කිරිදියෙනි දෙවියත්
කවුඩු කලහස් නොවනෙව්
දුදනා යහ කිසට අව
කොලහලය සුදනන් හා

(ගී විරිත)

**දුර්ජනයාගේ එකම පරමාර්ථය නිරන්තරයෙන් ම මෙරමාහට උපද්‍රව පැමිණවීම යැ යි පැවැසේ.**

23 වග විසුම ගොනුනගෙ
වනසට හේතුවන මෙන්
දුදනගෙ ගතිය පරනට
උවදුරු පැමිණ වීමය

(ගී විරිත)

**සත්පුරුෂයා සත්ගුණත් අසත්පුරුෂයා දුර්ගුණත් ලගා කැරැ ගනිති.**

24 කුලු කෙටිය දහවියා හැර සහල ලැබ ගනියි
සුදන දෙස් හැරපියා ගුණයන් ම හැර ගනියි
පෙරේණය හොඳහැරා රොඩු හරිය රැක ගනියි
එමෙන් කුත්සිත එකා හොඳ අතැර දෙස් ගනියි

(වියන් විරිත)

**දුර්ජනයාගේ ස්වභාවික ගතියක් මෙසේ දැක්වේ.**

25 ගනබෙහි සසල මෙන්
දුදනෝ කිපෙති නොකරුණැ
පහදිති හේතු රහිතවැ
සැහැවියයි මේ ඔවුනගෙ

(ගී විරිත)

26 ඛලොන සාධුතාං යාති
සද්භිඃ සංබොධි තොපිසන්
සරිත්පූර ප්‍රපූණොපි
ක්‍ෂාරො න මධුරායතෙ

(ශාර්ංගධර පද්ධති)

27 අශක්තාඃ ශක්තිමාත්මීයාං
ශ්ලාඝ්‍යනෙන ච දුර්ජනාඃ
තෙ භවන්ත්‍යුපහාසාය
මහතා මෙව සන්නිධෞ

(ශාර්ංගධර පද්ධති)

28 සර්පඃ ක්‍රූරඃ ඛලඃ ක්‍රූරඃ
සර්පාත් කරතරඃ ඛලඃ
මන්ත්‍රෙණ ශාම්‍යතෙ සර්පො
න ඛලඃ ශාම්‍යතෙ කදා

(හ. සං.)

29 ඛලාස්තු කුශලාඃ සාධොර්
හි ප්‍රත්‍යූහ කර්මණි
නිපුණාඃ ඵණිනඃ ප්‍රාණා
නපහර්තුං නිරාගසාම්

(රසගංගාධර)

---

27 උවහසට – උපහාසයට.

28 මතුරින් – මන්ත්‍රයෙන්.

**සත්පුරුෂ අවවාදයෙන් දුර්ජනයා සුදනකු නොවන බවට උක්තියෙකි.**

26 ගඟ දිය වැදූ මහ සමුදුර පිරුන ද
ලුණුරස සුමිහිරි බවට නොයන ලෙ ද
සුදනන් කොතෙකුත් ඔවදන් දුන්න ද
දුදනා සුදනකු වනුයේ කෙලෙස ද ?

(පෙද විරිත)

**ආත්ම වර්ණනය දුර්ජනයාගේ චරිත ලක්‍ෂණයෙකැයි යෙති**

27 දුදනෝ තමන් ගුණ
මහ ඉහළින් ම පවසති
ඉන් සත් සමාගමයෙහි
ඔහු උවහසට ලක්වෙයි

(ගී විරිත)

**දුර්ජනයා ආශිර්විෂයාටත් වඩා භයානක බවට උක්තියෙකි.**

28 සප් දුදන කුරිරුය
දුදනා වඩා රුදුරුය
සංසිඳේ මතුරින් සප්
නොදමේ දුදන එලෙසෙක්

(ගී විරිත)

**සහපත් වැඩ විනාශ කිරීමට දුර්ජනයන් හපනුන් යැයි පැවැසේ**

29 අහිංසක දෙනෙතා
නැසීමට සප් සමතිය
එමෙන් දුදනෝ සත්වැඩ
වැනසුමට සමතෝ වෙති

(ගී විරිත)

30 තක්ෂකස්‍ය විෂං දන්තෙ
මක්ෂිකායා විෂං ශිරඃ
වෘශ්චිකස්‍ය විෂං පුච්ඡං
සර්වාංගෙ දුර්ජනො විෂම්

(චාණක්‍යශතක)

31 මනස්‍යන්‍යද්වචස්‍යන්‍යත්
කායෙෂ්වාන්‍යද්දුරාත්මනාම්
මනස්‍යෙකං වචස්‍යෙකං
කර්මණ්‍යෙකං මහාත්මනාම්

(චාණක්‍යශතක)

32 අපවාද දභිතස්‍ය
සමස්‍ය ගුණ දොෂයොඃ
අසද්වෘත්තෙ රහො වෘත්තං
දුර්විභාව්‍යං විධෙරිව

(කිරාතාර්ජුන)

33 අන්තර් මලීන දෙහෙන
වහිරාහ්ලාද කාරිණා
මහාකාල ඵලෙ නෙව
කෙටලෙන නවාඤ්චිතාඃ

(කවිතාමෘත)

---

30 විසදරයාගේ - නයාගේ, නුහුසු - ගොනිස්සා (ගෝන+ඉස්සා)

31 තුන්තැන - සිතීම කථාව හා ක්‍රියාව යන තුනය.

33 අබතුර - අභ්‍යන්තරයෙහි, බැහැරින් - බාහිරව, කනාපල - අත්තන ගෙඩිය, නුළුවූ - නොරැවටුණේද.

**දුර්ජනයාගේ ගත පුරා ම විෂ පැතිර ඇතැයි උක්තියෙකි.**

30 විසදරයාගේ දළගෙහි විස ඇත
මීමැස්සාගේ තුඩගෙහි විස ඇත
නුහුසුගණාගේ වලගෙහි විස ඇත
දුදනාගේ ගත පුරප ම විස ඇත

(පෙද විරිත)

**දුදනාගේත් සුදනාගේත් සිතිමේ කිමේ හා ක්‍රියාවේ වෙනස මෙසේ දක්වේ**

31 දුදනගෙ සිතැ එකෙක
බසෙහි ඇත්තේ වෙනෙකක
කරනුයෙ තවත් අනිකෙක
සුදන තුන් තැන එක බඳු

(ගී විරිත)

**දුර්ජනයාගේ ගති පැවතුම් විසඳිම දුෂ්කර බව් පැවැසේ.**

32 අවමනකට කිසි ලෙසකින් බියක් නැති
ගුණදෙස් දෙකෙහි සම සම වන නැණක් ඇති
කොහොමත් තුටු නොකළ හැකි දුදනාගෙ ගති
පැවැතුම් ඉරණමක් මෙන් කිව හැකි නොවෙති

(සමුදුරුගොස විරිත)

**දුර්ජනයාගේ අභ්‍යන්තර බාහිර පෙනීම මෙසේ දක්වේ.**

33 අබතුරු දෙස් පිරු
බැහැරින් ඉතා පිවිතුරු
කණපල වන් දුදනා
හමියෙහි නුඑද කවරෙක් ?

(ගී විරිත)

34 බලෙන ධන මත්තෙන
නෘපෙන ප්‍රභවිෂ්ණුනා
පිශුනෙන පදස්ථෙන
හා ප්‍රජේ ක්ව ගමිෂ්‍යසි

(සුභාෂිතාවලි)

35 යථා ගජපතිඃ ශ්‍රාන්ත-
ච්ඡායාර්ථී වෘක්ෂ මාශ්‍රිතඃ
විශ්‍රම්‍ය තං ද්‍රැමං හන්ති
තථා නීච ස්වමාශ්‍රයම්

(සුභාෂිතාවලි)

36 චාරුතා පරදරාථීං
ධනං ලොකොප තප්තයෙ
ප්‍රභුත්වං සාධු නාශාය
බලෙ බලතරා ගුණාඃ

(සුභාෂිතාවලි)

37 කරොති පූජ්‍යමානො'පි
ලොකව්‍යසන දීක්ෂිතඃ
දශීතෙ දශීතෙ ත්‍රාසං
ගෘහා හිරිව දුර්ජනඃ

(සුභාෂිතාවලි)

---

34 පිසුණයෙකුත් – කේළමෙකුත්.

35 ඉපුඹු – විමචකය.

**සංස්කාර ත්‍රි පුද්ගලයන් සමග විනාශය කරා යන ගමනක් පිළිබඳ උක්තියෙකි.**

34 දනෙන් මත් දුදනත්
බලයට නැඟි නිවයත්
පිසුණයකුත් සමග අහෝ !
මිනිස, ඔබ කොහි යන්නෙහි ?

(ගී විරිත)

**කෘතෝපකාරයට අපකාරයක් ම කිරීම දුර්ජනයාගේ චරිත ලක්ෂණයෙකැයි කියති.**

35 වෙහෙසට පත් මදූතා තුරු සෙව නෝ
ඉසුඹු නිවාගෙන ගස බිඳ හෙල නෝ
එලෙස වහළ ලැබැ දුදනා නිති නෝ
අපකාරය මැයි පෙරළා යොද නෝ

(පෙද විරිත)

**දුර්ජනයාගේ ගති පැවැතුම් සමහරක් මෙසේත් දක්වෙයි.**

36 පරදර දුසිරිත විලාස බවට යි
දනරුස පරනට තාපය දෙන්ට යි
අදිපති බව සුදනන් වැනසුමට යි
මේ දුදනාගේ ඇතිගති සිරිතු යි

(පෙද විරිත)

**සැලකිලි කළ ද දුර්ජනයාගෙන් විපතක් ම වේදැ යි උක්තියෙකි.**

37 දුදනා ගෙහි වෙසෙන
නයකු සේ දුටු දුටුවෝ
බියවෙති සැලකිලි කළද
විපතක් ම හේ සලසයි

(ගී විරිත)

38 යථා පරොපකාරෙෂු
නිත්‍ය ජාගර්ති සජ්ජනඃ
තථා පරාපකාරෙෂු
ජාගර්ති සතතං ඛලඃ

(මනුස්මෘති)

39 වෘථාජ්වලිත කොපාග්නෙඃ
ඵරුෂාක්ෂර වාදිනඃ
දූර්ජන සෞෂධං නාස්ති
කිංචිදන්‍ය දනුත්තරාත්

(සුභාෂිතාවලි)

40 රවි රපි න දහති තාදෘග්
යාදෘක්සංදහති වාලුකා නිකරඃ
අන්‍යස්මාල්ලබ්ධ පදෙ
නිචඃ ප්‍රායෙණ දුඃසහො භවති

(රසගංගාධර)

41 කෘතමපි මහොපකාරං
පය ඉව පිත්වා නිරාතඞ්කම්
ප්‍රත්‍යුත හන්තුං යතතෙ
කාකොදර සොදරඃ ඛලො ජගති

(රසගඃගාධර)

---

40 කිරණ – රශ්මිය, පුලිනතල – වැලිතලාව.

41 පූ – බිවාවූ, ඝසනට – දෂ්ට කිරීමට.

**සත් අසත් දෙදෙනාගේ නිරන්තර ක්‍රියා පටිපාටිය මෙසේ දක්මේ.**

38 සුදනා නිරතුරවැ
යෙදෙයි පර උපකාරෙහි
අසත් පුරිසා නොමතොරවැ
යෙදෙයි පර අපකාරෙහි

(ගි විරිත)

**මිනිසාගේ දුර්ගති රෝගයට නිසි ඖෂධයක් නොමැති බව පැවැසේ.**

39 නොකරුණෙයෙහි කිපෙන
රළු බස් බෙණෙන නොකරුණු
දුදනාගෙ මේ රෝගෙට
නොමැත්තේ නිසි ඔසුවක්

(ගි විරිත)

**නිවයාට ලැබෙන සුළු නිලශ ජනතාව පෙළීමට අවියක් වේයසි උක්තියෙකි.**

40 හිරු වෙතින් පතළවන කිරණ ඉවසත හැකි යි
එහෙත් ඉන් තාපලත් පුලිනතල මරු සැර යි
උසස් තැන හෙබි සුදනා තාපයක් ගෙන නොදෙ යි
ඔහු දුන්න සුළු නිලෙන් නිවයා දන පෙළ යි

(වියත් විරිත)

**උපකාරයක් කල සත්පුරුෂයාට දුර්ජනයා අපකාරයක් ම කරයි.**

41 දුනු කිරි පූ නයා
දුන් අය ම ඩසනට යෙයි
දුදනාද විහළක් ලැබ
දුන් අය ම නසනට යෙයි

(ගි විරිත)

42 නලිකාගත මපි කුටිලං
න භවති සරලං ශුනඃ පුච්ඡම්
තද්වත් ඛල ජනහෘදයං
බොධිත මපි නෛවයාති මාධුර්‍ය්‍යම්
(රසගංගාධර)

43 ධර්‍මාරම්භෙ'ප්‍ය සතාං
පරහිංසෛව ප්‍රයොජිකා භවති
කාකානාමභිෂෙක-
කාරණ තාං වෘෂ්ටිරනු භවති
(භාමිනි විලාස)

44 ලබ්ධොදයො'පිහි ඛලඃ
ප්‍රථමං ස්වජනං තනොති පරිතාපම්
උද්ගච්ඡන් දවදහ නො
ජන්මභුවං දරුනිර්දහති
(සුභාෂිතාවලි)

45 ප්‍රබලා එව ගුණවතා මාක්‍රම්‍ය
ධුරං පුරඃ ප්‍රකර්ෂන්ති
තෘණ කාෂ්ටමෙව ජලධෙරු-
පරි ප්ලවතෙ න රත්නානි
(සුභාෂිතාවලි)

---

42 වක – ඇදය.

44 වහරේ වරනු – වෑසි නවතිය, රැකුරනුද – ඇරඹීම ද.

45 ඉකුමෙනිදිරියෑ – ඉක්මවීමෙන් ඉදිරියෙහි.

**දුර්ජන හෘදයෙහි වක්‍ර ස්වභාවය කිසි විටෙක නොහැරේයැයි උක්තියෙකි.**

42 බලු වලග නළයෙක
ලා තුබුව වක නැරේ
කොතෙක් ඔවදන් දුන්නද
දුදන හද යහ නොම වේ

(ගි විරිත)

**දුර්ජනයාගේ පොදු වැඩ ද ජනතා පීඩනය පිණිස වන්නේ යැ යි යෙති**

43 කවුඩා නැවොතින්
වහරේ වරනු මතයෙක
එලෙසින් දුදන යහ වැඩ
රැකුරනුද පර තැවුලට

(ගි විරිත)

**නීචයාගේ භෞතික දියුණුව සජ්ජනයාගේ පීඩනයට ම හේතු වේ.**

44 ළැවු ගින්න පළමුව
එයැති කළ තුර දවනෙව්
නීචයා දියුණට අව
පළමුව තවයි සිය දන

(ගි විරිත)

**දුර්ජනයෝ බොහෝවිට සත්ජනයන් පසුබා ඉදිරියෙන් සිටිති.**

45 තණ රොඩු දර කැබැලි
දිය පිටය රත් නො එසේ
එමෙන් දුදනෝ සුදනන්
ඉකුමෙති දිරියැ වොරදති

(ගි විරිත)

46 ස්ව ගුණානිව පරදෝෂාන් වක්තුං
නසතො'පි ශක්නු වන්ති බුධාඃ
ස්වගුණා නිව පරදෝෂා
නසතො'පි බිලාසතු කථයන්ති

(සුභාෂිතාවලි)

47 කෘත්වාපි යෙන ලජ්ජා-
මුපෛති සාධුඃ පරොධිතෙනා'පි
තදකෘතෙනෛව බල ජනඃ
ස්වයමුද්ගිරතිති දිග්ලඥතාම්

(සුභාෂිතාවලි)

48 සහජාන්ධ දෘශඃ ස්වදුර්නයෙ
පරදොෂෙක්ෂණදිව්‍ය චක්ෂුෂඃ
ස්වගුණොච්ච ගිරො මුනිව්‍රතාඃ
පර වර්ණ ග්‍රහණෙෂ්වසාධවඃ

(ශිශුපාලවධ)

49 උපකාර පරඃ ස්වභාවතඃ
සතතං සර්වජනස්‍ය සජ්ජනඃ
අසතාමනිශං තථාප්‍යහො
ගුරු හෘද්‍රොගකරි තදුන්නතිඃ

(ශිශුපාලවධ)

---

47 යෙදී – කියයි.

48 අඳැස් – අන්ධවූ ඇස්.

**සත්පුරුෂයා හා අසත්පුරුෂයා පරගුණය සහ ස්වගුණය දක්නා අයුරු මෙසේ පැවැසේ**

46 සුදනා මෙරමා දෙසැතත් නොකිය යි
තම සත් ගුණයන් කිසිවක් නොවණ යි
දුදනා මෙරමා නැතිදෙස් තෙපල යි
තම සත් ගුණයක් නැති මුත් පසස යි
(පෙද විරිත)

**දුර්ජනයාගේ ආත්ම වර්ණනාවට නින්ද වේවා !**

47 සුදනා කළ උපකාරද කිසිව ක්
අනිකකු කියතත් ඇසුමද විළිය ක්
දුදනා යෙයි නොකර ම කළ පවත ක්
ජීවකමට නින්ද වනු තහම ක් !
(පෙද විරිත)

**අසත්පුරුෂයාගේ ස්වදෝෂ හා පරදෝෂ දැකීමේ වෙනසත් ස්වගුණ හා පරගුණ භාෂණයේ පරස්පර තාවයත් මෙසේ දැක්වේ.**

48 දුදනට සියදෙස නොදිසි අඳැස් ඇත
පරදෙස සුළුවුව දක්න දිවැස් ඇත
තම වරුණෙට සුරු බුහුටි දිවක් ඇත
පරගුණ කිමෙහි දිව ගොළුවක් ඇත
(පෙද විරිත)

**සාධු ජනයා ලාභාපේක්ෂාවෙන්තොරව කැරෙන පරෝපකාර සේවයද දුර්ජනයාගේ හෘදය පීඩනයට හේතු වන බව පැවැසේ.**

49 හුදිදන නිසගින් කිසිවක් නොපතා
පර උපකාරය සලසති සතතා
ඉන්ලද කිත් දියුණුව දුට නියතා
දුදනා හද දයයි නොව නැවතා
(පෙද විරිත)

50 පරිතප්‍යත එව නොත්තමඃ
පරිතප්තො'ප්‍යපරඃ සුසංවෘතිඃ
පරවෘද්ධිභිරාහිත ව්‍යථඃ ස්ඵුට
නිර්භින්න දුරාශයො'ධමඃ

(ශිශුපාලවධ)

51 ප්‍රකටමපි න සංවෘණොති දෙහං
ගුණලව ලම්පට එෂ සාධුවර්ගඃ
අතිපරුෂ රුෂං විනාපි දෙෂෛඃ
පිශුන ශුනාං භෂතාං ප්‍රයාති කාලඃ

(සුභාෂිතාවලි)

52 එව මෙව තහි පිව්‍යතෙ බලා-
තත්‍ර කා නෘපති වල්ලභෙ කථා
පූර්වමෙව හි සුදුඃ සවභානලඃ
කිං පුනඃ ප්‍රබල වායු නෙරිතඃ

(කාව්‍යප්‍රකාශ)

53 නදුර්ජනඃ සජ්ජනතාමුපෛති
බහිප්‍රකාරෛරපි සෙව්‍යමානඃ
භූයොපි සික්තඃ පයසා ඝෘතෙන
න නිම්බ වෘක්ෂො මධුරත්ව මෙති

(චාණක්‍යශතක)

---

50 දෙසිත් තිපත් වෙයින් තැපී - ද්වෙශයෙන් උපන්නා වූ වෙදනාවෙන් පිඩාවී.

53 නිඹ - කොහොඹ.

**මෙරමං දියුණ ගැන උත්තම මධ්‍යම අධම තුන්වැදෑරුම මිනිසුන්ගේ හැගීම් මෙසේ දක්වේ.**

50 උතුම් දනා පරදියුණට ඉඩි සිත් නොව ඩති
මැදුම් දනා ඉසිය ඇතද එය නොම හඟ වති
අදම දනා මෙරමාගේ දියුණට රිසි නැති
දෙසින් නිපත් වෙයින් තැපි එළිපිට පව සති

(වියත් විරිත)

**නීචයං සුනඛයං මෙන් අනුන්ට දරුණු ලෙස බුරමින් කාලය ගෙවන බවෙකි.**

51 දුටත් අනුන් දෙස සුදනා නොකිය යි
සුළු මුත් ඇති ගුණ නොලොබව තෙපල යි
පිසුණු නමැති බලු නැතිඳෙස පවස යි
උගේ වැඩෙ දරුණුව නිති බිරුම යි.

(පෙද විරිත)

**නීචයාට පාලක බලය අත්වූදට සිදුවන දෑ මෙසේ දක්වේ.**

52 ගින්න රුදුයි සුළඟද තව ඊට එක් වුවො ත්
එයින් මෙහයවන විට එහි වැඩෙයි බල තව ත්
නීචයාට පාලන බලයද අත්වුව හො ත්
වන්නේ ඒ ලෙසයි වැඩෙයි රුදුබව බලව ත්

(වියත් විරිත)

**දුදනාං සුදනකු කිරීම උගහට බව් මෙසේ දක්වේ.**

53 කිරි හා ගිතෙලත් ඉස ඉස වැඩුව ද
නිඹතුර ඉමිහිරි ගතියට එළඹෙ ද ?
එලෙසින් කොයිලෙස ඇසිර පැවැත්වි ද
දුදනා කදහස සුදනකු වේවි ද ?

(පෙද විරිත)

54 විද්‍යා විවාදාය ධනං මදය
ශක්තිඃ පරෙෂාං පරිපීඩනාය
බලස්‍ය සාධොර් විපරීත මෙතත්
ඥානාය දානාය ච රක්‍ෂණාය

(ගුණරත්න)

55 කස්තූරිකාං තෘණභුජා මටවී මෘගාණාං
නික්ෂිප්‍ය නාභිෂු චකාර ච තාන්වධාර්හාන්
මූඪෝවිධිඃ සකල දුර්ජනලොල ජිහ්වා
මූලෙස්ම නික්ෂිපති චෙත් සකලොපකාරඃ

(කුවලයානන්ද)

56 රූක්‍ෂං විරෞති පරිකුප්‍යති නිර්නිමිත්තං
ස්පර්ශෙන දූෂයති වාරයති ප්‍රවෙශම්
ලජ්ජාකරං දශති නෛව ච තෘප්‍යතීති
කෞලෙය කස්‍ය ච කලස්‍ය ච කොවිශෙෂඃ

(සුභාෂිතාවලි)

57 මලයභුවි විරූඪශ්චන්දනෙ නාභිවෘද්ධා
න භජති කිලවෙණුඃ සෞරභං චන්දනස්‍ය
තදිහනහි විචිත්‍රං සර්වදෙෂාකරාණාං
නහි භවති කලානාං සාධුතා ගන්ධ ලෙශඃ

(සුභාෂිතාවලි)

---

55 හරිණංග – මුවන්ගේ, නැබැතුළත – පෙකණිය තුළ.

56 තිස්වනු නොමැතියි – සෑහීමකට පත් නොවෙයි.

**අසත්පුරුෂයා හා සත්පුරුෂයා ස්වකීය විද්‍යාව ධනය හා ශක්තිය යොදන්නේ දෙවැදෑරුම් අයුරෙකිනැයි යෙති.**

54 දුදනගෙ විදු වාදෙට දන මිදය ට
සවිබල වෙයි දෙනෙතා නිති පෙළුම ට
සුදනගෙ විදුසත නැණබල වැඩුම ට
දන දන් දීමට බල දන රැකුම ට

(පෙද විරිත)

**මහ බඹංවද වැරදුන තැනක් ගැන මෙසේ දක්වේ.**

55 දුරදිග නොබැලූ මහබඹු කස්තුරි බෙහෙ ත
තණකන අහිංසක හරිණගෙ නැබැතුළ ත
තැබුයෙන් උන්ගෙ දිවියට වෙයි මහ විප ත
තැබිනම් දුදන දිවමුලැ එය ලොවට සෙ ත

(සමුදුරු ගොස විරිත)

**නීචයන්ගේ චරිත මෙසේ විස්තර කැරෙයි.**

56 රළු හඩ දෙයි නිකම් කිපෙයි අතගැ අත කිළිටි කැරෙ යි
එනු වලකයි පනියි ඩසයී කිසිවිට තිත්වනු නොමැති යි
මෙකී සියලු ගති ඇත්තේ පහත් නිච බල්ලාගෙ යි
උගෙත් නීච දුදනාගෙත් කියනු තිබෙන වෙනස කිමැ යි

(දඹු විරිත)

**සකල මහා දෙෂයනම අංඝරයක් බදු දුර්ජනයා තුළ ගුණ සුගන්ධයක් කැලම නොපවත්නා බවම උක්තියෙකි.**

57 මලයගිර සඳුන් තුරු තුරු වැඩුන නමු ත්
සඳුන් සුවඳ විහිදේවිද උණගසිනු ත්
දෙස්නට අකරවන් දුදනාගේ කොහොම ත්
සත්ගුණ සුවඳ පවතීවිද ගැවිලාව ත්

(සමුදුරු ගොස විරිත)

58 ශමයති යශඃ ක්ලෙශං සූතෙ දිශත්‍ය ශිවාං ගතිං
ජනයති ජනොද්වෙගායාසං නයත්‍යුපහාස්‍යතාම්
භ්‍රමයති මතිං මානං හන්ති ක්‍ෂිණොති ච ජීවිතං
ක්‍ෂිපති සකලං කල්‍යාණානාං කුලං ඛල සංගමඃ

(සුභාෂිතාවලි)

59 වන්ද්‍යාං නින්දති දුඃඛිතානුපහසත්‍යා බාධතෙ බාන්ධවාන්
ශූරාන් ද්වෙෂ්ටි ධනච්‍යුතාන් පරිභවත්‍යා ලොපයත්‍යාශ්‍රිතාන්
ගුහ්‍යානි ප්‍රකටී කරොති සටයන් යත්නෙන වෛරාශයං
බ්‍රෑතෙ ශිස්‍රමවාච්‍යු සෘජ්ඣති ගුණාන් ගෘහ්ණාති දොෂාංඛලඃ

(සුභාෂිතාවලි)

60 හෙ දරිද්‍ය නමස්තුභ්‍යං
සිද්ධොහං ත්වත් ප්‍රසාදතඃ
පශ්‍යාම්‍යහං ජගත් සර්වේ
නමාං පශ්‍යති කශ්චන

(ශාර්ංගධර පද්ධති)

61 ඉහලොකෙපි ධනිනාං
පරොපි ස්වජනායතෙ
ස්වජනොපි දරිද්‍රාණාං
තත් ක්‍ෂණාද් දූර්ජනායතෙ

(සුභාෂිතාවලි)

---

58 අසත් සංගමයේ – අසත්පුරුෂ සමාගමයෙහි.

59 සුරුවනට – සූරයන්ට, කවන් – කෘපණයන්, සබඳුනට – නෑයන්ට.

**අසත් සංගමයේ දුර්විපාක මෙසේ දක්වේ**

58 යසස කෙලෙසෙයි දුක ම දනැවෙයි
කෝපවේගය දැඩිවැ උපදි යි
නොසුව ගෙනදෙයි මතිය වැනසෙයි
සෙබෙහි උපහාසයට ලක්වෙ යි
මානවත් බව සිදී සුන්වෙයි
සියලු යහපත් ගතින් දුරුවෙ යි
හීනවෙයි ජීවිතෙත් මේ හැම
අසත් සංගමයේ විපාක යි
(දඹු විරිත)

**දුර්ජනයාගේ නිසග සිරිත් මෙසේ ද දක්වේ.**

59 වැඳිය යුත්තට කරයි ගැරහුම් දුප්පතුන්හට නිගා පවස යි
සබඳුනට හිරිහැරම පමුණයි සුරුවනට ඉසි සිතම වඩව යි
රහස් වපුරයි කවන්ගරහයි ඇසිරියන්හට නිති පනව යි
ගුණය දෙසලෙස දකියි මෙකී සියල්ලම දුදනාගෙ සිරිතයි
(දඹු විරිත)

**දනිසුරාට දිළින්දා නොපෙනීම ගැන දිළිඳු බව අමතා කැරෙන උපහාසයෙකි.**

60 එම්බා දිළිඳු බව ! තට මම වඳින් නෙමි
තා නිසා කරුණු බොහොවක් උගත් තෙමි
මුළුලොව වෙසෙන හැම දෙනමත් මෙමට පෙනේ
එනමුදු කිසිවෙකුටවත් මා නම් නො පෙනේ
(දෙපියවිරිත්)

**වස්තුව ඇති කල්හි හා නැති කල්හි නෑනෑ හා නෑ සබඳතාව ගැන උක්තියෙකි.**

61 වස්තුව කෙනකුට ඇතිද පමාණව
රටවුද එති නෑයන්ට සමානව
දිළින්දට තම සම ලේ නැයොත්
විපත්තිකර අහිතව දුදනෝ වෙත්
(දෙපියවිරිත්)

2 චාණ්ඩාලශ්ච දරිද්‍රශ්ච
ද්වාවෙතෞ සදෘශාවිහ
චාණ්ඩාලස්‍ය න ගෘහ්ණන්ති
දරිද්‍රො න ප්‍රයච්ඡති

(ප්‍රසංගාභරණ)

63 කිං කරොමි ක්ව ගච්ඡාමි
කමුපෛමි දුරාත්මනා
දුර්භරෙණොදරෙනාහං
ප්‍රාණෛරපි විඩම්බිතඃ

(ප්‍රසංගාභරණ)

64 දුඃඛං දුඃඛ මිති බ්‍රෑයාන්
මානවො නරකං ප්‍රති
දරිද්‍ර්‍යාදධිකං දුඃඛං
න භූතං න භවිෂ්‍යති

(ප්‍රසංගාභරණ)

65 යදිනාම කුලෙ ජන්ම
තත්කිමපීං දරිද්‍රතා
දරිද්‍රත්වෙපි මූර්ඛත්ව
මහො දුඃඛ පරම්පරා

(සුභාෂිතාවලි)

**සැඩොලාගෙන් නොගැනීමත් දිළින්දාගේ නොදීමත් ගැන උක්තියෙකි.**

62 සැඩොලගෙ දිළින්දගෙ
සමතාවයෙක් දක්වෙ
සැඩොලහුගෙන් නොම ගනිත්
නොදෙයි දිළිද කිසිවක්

(ගී විරිත)

**දිළිදු බව සාගින්න හා මරණය**

63 මම කුමක් කරනෙම
කවරකු වෙතට යන්නෙම
නොදැරිය හැකි මරණයත්
වියහැකි සයින් පෙළෙමී

(ගී විරිත)

**දිළිඳුකමට වැඩි දුකක් තවත් ඇතිවිය හැක්කේ ද ?**

64 නරකයෙහි ඇත්තේ
"දුක දුකැ" යි යෙයි මිනිසා
දිළිඳු කමට වැඩි දුකක්
දැනුත් නැත මතුයෙ ද නැත

(ගී විරිත)

**දිළිදු බවට අඥාන බවද එක්වුවහොත් දුකෙහි සීමාවෙක් නැතැයි යෙකි.**

65 යම්කිසි කුලයෙක උපනොත්
එය දුප්පත් වුව කම්නැත්
මෝඩ කමත් එක් වුවහොත්
එතැන දුකෙහි ඉමක් නොමැත්

(දෙළොස්මත් ගී)

66 වරං හි නරකෙ වාසො
න තු දුශ්චරිතෙ ගෘහෙ
නරකාත් ක්ෂීයතෙ පාපං
කුගෘහාද් පරිවර්ධතෙ

(සුභාෂිතාවලි)

67 ධර්මාර්ථ කාම හීනස්‍ය
පරකීයාන්නභොජනඃ
කාකස්‍යෙව දරිද්‍රස්‍ය
දීර්ඝමායුර් විඩම්බනා

(සුභාෂිතාවලි)

68 කණ්ඨෙ ගද්ගදතා ස්වෙදෙ
මුඛෙ වෛවර්ණ්‍ය වෙපථුම්
ම්‍රියමාණස්‍ය චිහ්නානි
යානි තාන්‍යෙව යාචතඃ

(මෘච්ඡකටිකා)

69 පක්ෂ විකලශ්ච පක්ෂී
ශුෂ්කශ්චතරුඃ සරශ්චජලහීනම්
සර්පශ්චොද්ධෘත දංෂ්ට්‍රස්
තුල්‍යං ලොකෙ දරිද්‍රශ්ච

(මෘච්ඡකටිකා)

---

66 නරකයෙහි – අපායෙහි.

68 මුවැමර – මුඛය විවෘත වෙයි,

69 ඛගවියා – පක්ෂියා, විසදරා – නාගයා, දූවිරුක – දඟි[illegible]ක්ෂය.

**අපා දුකෙහි ගෙවිමකුත් දුරාචාර ගෘහ වාසයේ ම වැඩිමකුත් වන බව පැවැසේ.**

66 දුසිරිත ඇති ගේ වාසේ හොඳක් නෑ කියිත් යම්
නරකයෙහි වැටීමෙන් දුක් විඳීමත් උතුම් වේ
එහිදී දුක විඳීමෙන් පව් සියල්ලක් ගෙවී යෙයි
දුසිරිත ඇති ගෙයි වාසෙන් තවත් ඊට එක් වෙයි

(මාලිනී විරිත)

**දිළින්දගේ ආයුෂ වර්ධනය ද දුක වැඩි කරන්නකැයි පැවැසේ.**

67 දහමත් දනයත් දෙකින් ම තොරනම්
කවුඩා මෙන් අනුනගෙ බත් කානම්
එවන් දිළින්දගේ ඇති ආයුස
දික්වූ තරමට වැඩිවේ දුක් රැස

(දෙපිය විරිත)

**පණ ඇදීමේත් ඉල්ලීමේත් වැඩි වෙනසෙක් නැතැයි යෙයි.**

68 මර ළං වෙන උගුර
"ගොද ගොද" නැගී මුවැරේ
ඉල්ලන තැනැත්තහුගෙද
මේ අව ලකුණු දැක්වේ

(ගී විරිත)

**දිළිඳු බවට සමාන වෙනත් අවාසනාවන්ත තතු මෙසේ දැක්වේ.**

69 තටු සිඳු කගවියා
දැවි රුකය් සිඳි විලය්
දළ මිදූ විසදරා
සහ දිළින්ද ද සමය්

(ගජගති විරිත)

70 අම්බා තුෂ්‍යති න මයා
න ස්නුෂයා සාපි නාම්බයා න මයා
අහමපි න තයා න තයා
වද රාජන් කස්‍ය දෝෂො‍ඓ
(සුභාෂිතාවලි)

71 දරිද්‍රයා න්මරණාද්වා
මරණං සංරොචතෙ න දරිද්‍රයම්
අල්පක්ලෙශං මරණං
දරිද්‍රයමනන්තකං දුඃඛම්
(මෘච්ඡකටිකා)

72 තාවත් සන්ති සහායා
යාවජ්ජතුර්න කෘච්ඡ්‍රම්ප්නොති
අභිපතති ශිරසි මෘත්‍යෞ
කංකඃ ශක්තඃ පරිත්‍රාතුම්
(සුභාෂිතාවලි)

73 ඝෘත ලවණ තෛල තණ්ඩුල
ශාකෙන්ධන චින්තයානු දිනම්
විපුලමතෙරපි පුංසො
නශ්‍යති ධීර්මන්ද විභවත් වාත්
(සුභාෂිතාවලි)

---

72 නැතක් දෙන – බොහෝ දෙනා.

73 ඉන්දන – දල්වන දෑ එනම් දර,

**හැම දෙසටම මුල අනෙකක් නොව දිළිඳු බවයැයි යෙති.**

70 අම්මට මගෙනුත් ලේලිගෙනුත් නැත
කිසියම් සිත සතුට ක්
ලේලියටත් නැත අම්මාගෙන්වත්
මාගෙන්වත් සතුට ක්
මටත් ඇත්තෙ නැත අම්මාගෙන්වත්
බිරියගෙනුත් සතුට ක්
මහරජ කිවමැන ! මෙකට හේතුව
කාගේනම් වරද ක් ?
(මා. 26, දඹ විරිත)

**දිළිඳු දුකින් හා මරණ දුකින් වඩා මත් දරුණු කිම ?**

71 මරණය දිළිඳු කම
දෙකින් මරණය උතුම්
මරණ දුක එක් වරෙකය
දිළිඳු දුක අවසන් නැත
(ගි විරිත)

**මාරයා ආවිට කාගේ නම් පිළිසරණක් ද ?**

72 විපතක් නො එන තෙක්
වහළට නැතක් දෙන ඇත
මරු හිස මත හෙන කල්හි
දුරලයිද එය කවරෙක් ?
(ගි විරිත)

**දෛනික ජීවන සටන දිළිඳු නුවණැත්තාගේ නැණ හීන කැරෙන බව පැවැසේ.**

73 ගිතෙල් සහල් ලුණු පලාද ඉන් දන
මේවා ගැන සිත සිතා දිනෙන් දින
බොහෝ නුවණ ඇතියන්ගේ නුවණත්
හීන කැරේ නැතියෙන් දන සම්පත්
(දෙපිය විරිත්)

74 වීණාං වංසශ්චන්දනං චන්ද්‍රභාසඃ
ශය්‍යා යානං යෞවනස්ථාස්තරුණ්‍යඃ
නෛතද්ද්‍රව්‍යං ක්ෂුත්පිපාසාර්දිතානාම්
සර්වාරම්භාස්තණ්ඩුල ප්‍රස්ථමූලාඃ
(සුභාෂිතාවලි)

75 දරිද්‍ර්‍ය භොසත්වං පරමං විවෙකී
ගුණාධිකෙ පුංසි සදනුරක්තම්
විද්‍යා විහිනෙ ගුණ වර්ජිතෙ ච
මුහුර්ත මාත්‍රං න රතිං කරොති
(මෘච්ඡකටිකා)

76 අහොනු කෂ්ටං සතතං ප්‍රවාස–
ස්තතොති කෂ්ටඃ පරගෙහ වාසඃ
කෂ්ටාධිකා නිච ජනස්‍ය සෙවා
තතො'ති කෂ්ටා ධනහීනතා ච
(මෘච්ඡකටිකා)

77 යදනුභාග්‍යක්ෂය පීඩිතාං දශාං
නරඃ කෘතාන්තොප හිතාං ප්‍රපද්‍යතෙ
තදස්‍ය මිත්‍රාණ්‍යපි යාන්ත්‍ය මිත්‍රතාං
චිරානු රක්තො'පි විරජ්‍ය තෙ ජනඃ
(මෘච්ඡකටිකා)

---

74 මලයජසාරය – සුවඳ සඳුන්, වෙණ – වීනා, රිය – රථ.

75 විවසුමවක – විචාරකයෙක, විදුසත් – විද්‍යා ශාස්ත්‍ර.

77 අබැගියෙකින් – අභාග්‍යයෙකින්.

**හැම දුගකටම වඩා ආහාරය මුල්වේගැයි යෙනි.**

74 සයින් පෙළෙනහුට මලයජ සාරය
තුරුණු වමිය සඳරැස මන හාරය
වෙණ වස් දඹ රිය වහන් එපාමය
හැම කිසටම මුලවනු ආහාරය
(පෙද විරිත)

**දිළිඳුකම හා ජනසමාජය ගැන කැරෙන සියුම් උපහාසයෙකි**

75 එම්බා දිළිඳුකම ! තා හොඳ විවසු වෙක
ගුණවතුන් කෙරෙහි නිරතුරු ඇලෙන් නෙක
විදුසත් නොදත් ගුණයක් නොමැතියන් වෙත
මොහොතක් පවා කිසිද තගෙ ඇලුම් නැත
(දෙපිය විරිත්)

**හැමට ම වඩා වැඩි දුක දුප්පත්කමේ දුකයැයි උක්තියෙකි.**

76 අන් දේසයෙක්හි නිබඳින් විසුමත් දුකෙක් වේ
ඊටත් වඩා දුකෙකි වාසය අන් නිවෙස්හි
සේවාව නිවයකු වෙත් කැරුමත් දුකෙක් වේ
දුප්පත් කමේ ඇති දුකය් හැමටත් වඩා දුක්
(වසන්තිලක විරිත)

**මොනයම් අභාග්‍යයෙකින් හෝ විපත් කලක් එළැඹුනහොත් එදුට මිනිසාගේ තත්ත්වය කෙබඳු වෙයිද ?**

77 ඇබැගියෙකින් මිනිසට යම් කරදර
යුගයක් එළැඹුනහොත් සිටි වටකර
මිතුරෝ අමිතුර වී දෙති කරදර
හිතවත්හුද යෙති බවට අහිතකර
(පෙද විරිත)

78 භග්නාවයං පරිභවාසි හිරුග්‍රධාරෛ–
ර්දරිද්‍ය චණ්ඩ දහනෙන නිතාන්ත දග්ධාඃ
බන්ධූපකාර විෂමීත්වමපිහ භුක්තං
ජීවාම එව රවිජස්‍ය කිමස්ති නිද්‍රා

(මෘච්ඡකටිකා)

79 නිවාසශ්චින්තායාඃ පරපරිභවො වෛරමපරං
ජුගුප්සා මිත්‍රාණාං ස්වජන ජනවිද්වෙෂකරණම්
වනං ගන්තුං බුද්ධිර් භවති ච කලත්‍රාත් පරිභවො
හෘදිස්ථඃ ශොකාග්නිඃ දහති සන්තාපයති ච

(මෘච්ඡකටිකා)

80 සඛෙ ! ඛෙදං මාගාඃ කලයකිල තාස්තා නිජකලාඃ
ස්වකීත්‍යා වර්ධස්ව ක්වනු ඛලු තවෛතද්ව්‍යවසිතම්
න තන් මොඝත්‍යත්‍ර ස්ඵුරතිමිති චෙන්නෛතදුචිතං
විචිත්‍රොත්සාහානාං කිමිද මිය දෙව ත්‍රිභුවනම්

(ශාර්ංගධර පද්ධති)

81 නොසෙවා විහිතා ගුරොරපිමනාඞ්නොවා කෘතං පූජනං
දෙවානාං විධිවන්නවා ශිව ශිවස්නිග්ධාදයඃ සෙවිතාඃ
කිංතුත්වච්චරණෞ සරස්වතී රසාදජන්මනඃ සෙවිතෞ
තස්මාත් මාං විජහාති සා භගවතී ශංකෙ සපත්නී තව

(මෘච්ඡකටිකා)

---

79 නිගදිත් – නින්ද කරති, නැරිපුයි – නැයෝ සතුරෝය.

80 උත්දූකව – උනන්දුව

81 මවැලතින් – මා වෙතින්, සෙවෙති – උප භායඊා

**දිළිඳු ජීවිතයෙහි අත්දැකීම මෙසේ විස්තර කෙරෙයි.**

78 අනුන්ගේ නින්ද නමැති කඩුපතින් හද දදුරුයි වරින් වර
දිළිඳුබව නම් මහාගින්නෙන් දැවී ඉඳිනෙමු අපි නිරන් තර
නැදනගෙ උපකාර නම් විසහරද
වළදන්නෙමු නොයෙක් වර
එහෙත් නොමැරෙයි කුමන මරතින්දක්ද
මේ පණ නොයන අන් හැර
(දඹුවිරිත)

**දිළිඳුකමේ තවද අත්දැකීම් මෙසේ විස්තර කැරෙයි.**

79 දිළිඳු බව ඇති කල්හි සිතතුළ
පහළවෙයි නෙක කල්පනා වල්
සතුරෝ ඇතිවෙත් මිතුරෝ නිගදිත්
නෑ රිපුයි එයි පර සළුව වල්
බිරිය බැණ එයි වෙදක සිතැවෙයි
වන වැදීමේ කල්පනා වල්
පැතිර යයි සෝ ගින්න බොහොමයි
තාප සිත දැඩිවන වෙලා වල්
(දඹුවිරිත)

**දිළිඳුකම සිටු දැකිය හැක්ක. අවැසි වන්නේ උද්‍යෝගය බව කියැවේ.**

80 හිත මිතුර ! දුක් නොවනු කිත් ලබා ගන්න නම්
වැඩ කරව උත්සුකව දත් කලාවන් නහා
කොහිද තගෙ උන්නතිය දුන් ඉතින්වත් නගන්
පසු නොබසිනා දනට මේ ලොවත් තුන් ලොවය්
(විපිනතිලක විරිත)

**කවි ලිවීමෙන් භෞතික වශයෙන් පරිහානියට පත් දිළිඳු කිවියෙක් ලක්ෂ්මිය ගැන මෙසේ පවසයි.**

81 අතැර දැමෙන් ගුරුන් පිදුමයි
තිසි විදිසෙ දෙවියන් පිදී මයි
උපන්ද සිට කැරුන තරමක්
මිහිරි හරබර පැදි බැඳී මයි
මෙවිලසින් මා කෙළේ එම්බා
බගවතිය ! ඔබෙ පා සෙවී මයි
හහිමි මෙනිසා මවැලතින් ඔබ
සෙවෙති සිරිවමී පැනගියා යයි
(දඹුවිරිත)

82 දග්ධං ඛාණ්ඩවමර්ජුනෙන බලිනා දිව්‍යෛර්ද්‍රුමෛඃ
සෙවිතං
දග්ධා වායු සුතෙන රාවණපුරී ලංකා පුනඃ ස්වර්ණභූඃ
දග්ධඃ පඤ්චශරඃ පිනාකපතිනා තෙනාප්‍යයුක්තං කෘතං
දරිද්‍ර්‍යං ජනතාපකාරකමිදං කෙනා'පි දග්ධං නහි
(මෘච්ඡකටිකා)

83 දරිද්‍රයාත් ධ්‍රියමෙති හ්‍රීපරිගතඃ සත්ත්වාත්පරිභ්‍රශ්‍යතෙ
නිඃසත්ත්වඃ පරිභූයතෙ පරිභවාන් නිර්වේදමාපද්‍යතෙ
නිර්විණ්ණඃ ශුචමෙති ශොක නිහතො බුද්ධ්‍යාපරිත්‍යජ්‍යතෙ
නිර්බුද්ධිඃ ක්ෂයමෙත්‍යහො නිධනතා සර්වාපද මාස්පදම්
(සුභාෂිතාවලි)

84 දරිද්‍රයාත් පුරුෂස්‍ය බාන්ධවජනො වාක්‍යෙ න සන්තිෂ්ඨතෙ
සුස්නිග්ධා විමුඛී භවන්ති සුහෘදඃ ස්ඵාරී භවන්ත්‍යාපදඃ
සත්ත්වං හ්‍රාසමුපෛති ශීල ශශිනඃ කාන්තිඃ පරිම්ලායතෙ
පාපංකර්ම ච යත් පරෛරපි කෘතං තත්තස්‍ය සම්භාව්‍යතෙ
(මෘච්ඡකටිකා)

85 සංගංනෛව හි කශ්චිදස්‍ය කුරුතෙ සම්භාෂ්‍යතෙ නාදරාත්
සම්ප්‍රාප්තො ගෘහමුත්සවෙෂු ධනිනාං සාවඥමාලොක්‍යතෙ
දූරාදෙව මහාජනස්‍ය විහරත්‍යල්පච්ඡදො ලජ්ජයා
මන්‍යෙ නිර්ධනතා ප්‍රකාමමපරං ෂෂ්ඨං මහාපාතකම්
(මෘච්ඡකටිකා)

---

**82** අජුනයා - අර්ජුන කුමාරයා, කඩමහාවන - (මහාභාරත කථාවෙහි එන) ඛාණ්ඩව වනාන්තරය, වෑයුපුත් - හනුමාන්, රවුළුගේ - රාවණයාගේ, පන්සරා - පසවියා හෙවත් අනඟා.

84 විමුකවෙති - විටුපෑති

85 දනින්ගේ සාදයෙහි - ධනපති ගෙවල උත්සවයන්හිදී

**ලොව්, කොතෙකුත් ගිනි දෙන්නත් ඇතත් මේ දිළිඳු බව දවා හලු කරන්නට සමතෙකු නැතැයි යෙති**

82 අජුනයා දිවරැකැති කඩමහා වන දැවී
වායුපුත් රවුළුගේ ලක් පුරද ගිනි ලැවී
මෙහෙසුරා පත්සරා තිරපරා ශද් දැවී
දනතවන දිළිඳු බව දවන හපනෙක් නොවී
(වියත් විරිත)

**හැම උවදුරකටම මුල නොයෙක් හේතූන් අනුව දිළිඳු කමම යැ යි මෙසේ පැවැසේ.**

83 දිළිඳු කමින් ලජ්ජාවට පැමිණෙයි
ලජ්ජාවෙන් තෙද බල පිරි හෙයි
තෙද නැත්තේ නින්දවට පත්වෙයි
නින්ද ලැබුමෙන් දින කෙරෙයි
එයින් සෝකවෙයි සොවින් සියලු නැණ
පිරිහිමෙන් වනසට පත් වෙයි
අහෝ ! ලොවෙක හැටි ! දුප්පත් කම
මේ සියලු ම උවදුරු වලට මුලයි
(මා 30, දඹුවිරිත)

**මෙත් දිළිඳු බවේ දුර් විපාකයි.**

84 දිළින්ද කියන බස නැසියෝ නොසල කති
හිතවත්ව ඇසුරු කළ යහලුවෝ විමුක වෙති
බොහොවිපති බලපිරිහි සිරිතෙහිද සැකය ඇති
අනුන් කළ පව් පවා තම හිසට ගිලිති එති
(වියත් විරිත)

**දිළිඳු දුක කිය නොහැකි තරම් මහා පාපයෙකි.**

85 දිළින්ද සමග නැත ඇතැමෙකුගෙ කතා වක්
දනින්ගේ සාදයෙහි ලැබෙනුයෙද නිගා වස්
දනතාව දෙස බලන නැග එන්නෙ විලි බ වක්
බලන විට දිළිඳු දුක මහ ම මහ පාප යක්
(වියත් විරිත)

86 පෞරෙභ්‍යො න භයං න දණ්ඩ පතනං ත්‍රාසො නවා භූපතෙර්
නිඃ සංගං ශයනං නිශාසු ගමනං දුර්ගේෂු මාර්ගේෂු ච
දරිද්‍රෘං සුඛමෙව කෙවල මහො දෙෂ ද්වයං වර්තතෙ
ජායාතිනුති වාඤ්ඡා භොග සමයෙ මුඤ්චන්ති ෙවෙ යාචකඃ
(මෘච්ඡකටිකා)

87 පියාඃ කච්ඡපවත් තරන්ති සලිලෙ සංමාජීනී මීනවත්
දර්වී සර්ප විචෙෂ්ටිතානි කුරුතෙ සංත්‍රාසයන්ති ශිශූන්
ශූර්ප්‍රාර්ධාචෘත මස්තකා ච ගෘහිණී භිත්තිඃ ප්‍රපාතොන්මුඛී
රාත්‍රෞ පූර්ණ තඩාග සන්නිභ මහු ද්‍රාජන් මදීයං ගෘහම්
(මෘච්ඡකටිකා)

88 ශීලංශාතයති ශ්‍රැතං ශමයති ප්‍රඥං නිහන්ත්‍යාදරං
දෛන්‍යං දීපයති ක්ෂමාං ක්ෂපයති විවිධාමපි භ්‍යස්‍යති
තෙජො ජර්ජරයත්‍ය පාස්‍යති මතිං විස්තාරයත්‍යර්ථිතාං
පුංසඃ ක්ෂීණ ධනස්‍ය කිං න කුරුතෙ වෛරං කුටුම්බග්‍රහඃ
(සුභාෂිතාවලි)

---

86 දුර්ගෙහි – යෑමට දුෂ්කර මාර්ගයෙහි
87 කැසුබුවන් – කැස්බෑවුන්
88 සුතිදරුම – ධාරණ ශක්තිය

**දිළිඳු බවෙහි සුවයක් ඇති බවක්ද පැවැසේ**

86 දිළිඳු බවෙහි සුවයෙක්ද තිබෙ
පුරදනගෙන් බිය කිසිවක් නොයෙදෙ යි
රද දඬුවම ගැන කිසිම බියක් නැත
සැක නැතිවම නිදියන්ට හැකි යි
දුමගෙහි රමුත් නිබයව යැ හැක
එසේ වුවද දෙස් දෙකක් තිබෙ යි
බිරියගෙ ගැරහුම එකෙකි අනික නම
යදිදන මා අත් හැර යෑම යි
(දඹුවිරිත)

**කිවියෙක් දිළිඳු බවේ අත්දැකිම් උපමා ඇති රුසහුමකින් නිරිදුන්ට මෙසේ සැලකරයි**

87 කැසුබුවන් ලෙස පුපුද පාවෙයි
ඉදල මසකුසෙ දියේ පීන යි
හැන්ද නයකුසෙ ළමුන් බියකර
ජලය මතුපිට ඉලිප්පී ය යි
බිත්ති හිස පිට කඩා හැලෙතැයි
බිරිය කුල්ලෙන් හිස වසා ල යි
අනේ ! මහරජ ! රට වැස්සට
මගේ ගෙය විලකට සමාන යි
(දඹුවිරිත)

**ධනයෙන් පිරිහෙන්න පිරිහෙන්න මිනිසාට කුමක් නම් සිදු නො වෙයි ද ?**

88 සුසිල් හැදියා කෙමෙන් පිරිහෙයි
සුති දුරුම ඉවසීම දුරු වෙයි
බැගෑබව ඉහවහා යයි නැණ
මොටව ගොස් සිහියද නරක් වෙයි
තෙද බලත් අන්තිමට පිරිහෙයි
විලිබියද නැත්තටම නැති වෙයි
තව තවත් ඉල්ලීම වැඩිවෙයි
දන නොමැතිද කුමක් නො වෙතියි
(දඹු විරිත)

89 දෘෂ්ටං දූර්න වෙෂ්ටිතං පරිභවො ලබ්ධඃ සමානාජ්ජනාත්
පිණ්ඩාශී ධනිනාං කෘතං ඛලධිතං භූකතංකපාලෙෂ්වපි
පද්භ්‍යාං මධ්වනි සංප්‍රයාතමසකෘත් සුප්තං තෘණ ප්‍රස්තරෙ
යච්චාන්‍යත්‍ර කෘතං කෘතාන්ත කුරුෂෙ තත්‍රාපි සජ්ජාවයම්
(සුභාෂිතාවලි)

90 යො න දදති න භුඞ්ක්තෙ
සති විභවෙ නෛව තස්‍ය තද් ද්‍රව්‍යම්
තෘණමය කෘත්‍රිම පුරුෂො
රක්ෂති සස්‍යං පරස්‍යාර්ථෙ
(ශාර්ංගධර පද්ධති)

91 දතව්‍යං භොක්තව්‍යං සති
විභවෙ සංචයො න කර්තව්‍යඃ
පශ්‍යෙහ මධුකරීණාං
සංචිත මර්ථං හරන්ත්‍යන්‍යෙ
(ශාර්ංගධර පද්ධති)

92 දනෙන භූතානි වශී භවන්ති
දනෙන වෛරාණ්‍යපි යාන්ති නාශම්
පරොපි බන්ධුත්ව මුපෛති දනෛර්
දනංහි සර්ව ව්‍යසනානි හන්ති
(නෛෂධීය චරිත)

---

92 වසි කැරෙත් – සිත් ඇදගනිත්

**දිළිඳුකමේ පීඩාව විඳින්නකු සිය අත් දැකීම් විස්තර කැරෙමින් මාරයාට කැරෙන අභියෝගයෙකි.**

89 රුදු දුදනගෙ හැටි දුටුයෙම් සමතතු
ඇතියනගේ අවමන් විඳිනත ම
දනවත් ජනයා කබලෙක ලා දෙන
ඉඳුල් බතත් කාගෙන සිටියෙ ම
දුර බැහැරට දෙපයින්ම ගියෙම් තණ
ඇතිරිය මත සයනයද කෙළෙ ම
එම්බල මාරය ! තව කළ හැක්කක්
කරව එයත් ලැබුමට සැරසෙ ම
(දඬුවිරිත)

**පරහට නොදී තමන්ද නොවළඳා ධනය රැස්කර තැබීම පඹයාගේ කුඹුරු රැකීම මෙනැයි උක්තියෙකි**

90 දනයත් තිබී නොදී නොකා
ඉදිතොත් එයින් පලක් නොවේ
පඹයා ලෙසින් වෙලේ තබා
රැකදුන් ලෙසය් අනුන්ගෙ වී
(බුජඟ සඟිය විරිත)

**ධනය ඇත්තේ රැස්කර තබා රැකීමට නොව, තමන්ගේත් මෙරමාගේත් ප්‍රයෝජනය උදෙසා යැ යි යෙති.**

91 එක් රැස් කරන්නට නොවේ දන සම්පතාදී
දෙන්නත් බුදින්නටය ඒ පවතින්නෙ ලොවෙහි
එක්රැස් කරත් බිඟුහු මී අනිකෙක් බුදින්නේ
ඒ ලෙස්ති දීම වැළඳීම නැතොත් දනැත්තා
(වසත්තිලක විරිත)

**පරිත්‍යාගයෙහි අගය මෙසේ දකිත්.**

92 දීමෙන් දනෝ වසී කැරෙත්
කෝපාදියත් වහ, නැසේ
නැයන් සෙයින් දනෝ බැඳෙත්
දීමෙන් සියල් විපත් සිදේ
(නැරැසි විරිත)

93 ලොභාවිෂ්ටො නරො විත්තං
වීක්ෂතෙ න සවාපදම්
දුග්ධං පශ්‍යති මාර්ජාරො
න තථා ල ගුඩාහතිම්

(ශාර්ංගධර පද්ධති)

94 ලොභඃ සද විචින්ත්‍ය
ලුබ්ධෙභ්‍යඃ සර්වතො භයං දෘෂ්ටම්
කායඞාකායඞ විචාරො
ලොභ විමූඪස්‍ය නාසෙන්‍යව

(ශාර්ංගධර පද්ධති)

95 රක්ෂන්ති කෘපණාඃ පාණෞ
ද්‍රව්‍යං ක්‍රව්‍යමිවාත්මනඃ
තදෙව සන්තඃ සතත-
මුත්සෘජන්ති යථා බලම්

(ශාර්ංගධර පද්ධති)

96 අයං නිජඃ පරොවෙති
ගණනා ලඝු චෙතසාම්
උදර චරිතා නාන්තු
වසුධෛව කුටුම්බකම්

(ශාර්ංගධර පද්ධති)

---

96 කුටුම්බශ - පවුල

**කාණ්හාඩික මිනිසාට ධනය මිස ළඟ එන විපත නොපෙනේ.**

93 බළලුට පෙනුනේ කිරිටික පමණයි
හිස පෙහන පොලු පහරක් කිසි නොදකියි
මසුරා දක්නෙද දනරුස පමණයි
වැලතට එන කිසි විපතක් නොදකියි
(පෙද විරිත)

**මසුරු කමින් මෝහිත වූවහුගේ කළයුත්ත නොකළයුත්ත ගැන සිතා බැලීමෙක් නැත.**

94 සිතිය යුතුයි හරිහැටි ලොබ බව ගැන
මසුරු දනට බිය එළැඹෙයි හැම තින
කළ යුතු හෝ නොමකළ යුතු දෑ ගැන
ලොබින් මුළා වූව නොබලයි කිසි දින
(පෙද විරිත)

**මසුරාගේ අත රඳන ධනය හා සුදනාගේ අත රඳන ධනය ගැන උක්තියෙකි.**

95 මසුරා තම මස සෙ
රකියි දන තම අත තබාගෙන
සුදනා එම දනය
අතින් දුරලයි ලෙසින් කිළුටෙක
(සසාළිස්මත් ගී විරිත)

**ලාමක පුද්ගලයන්ගේ මමායනය හා උදාරවත් ශ්‍රේෂ්ඨ පුරුෂයන්ගේ පුළුල් අදහසුත් පිළිබඳ උක්තියෙකි.**

96 'මෙය මාගෙයි' 'මේවා මෙරමා ගෙ යි'
යනු බොලඳුන්ගේ ලාමක මතය යි
උදර සෙටයන් සිතනුයෙ මෙහෙම යි
මුළු පොළොව ම තම කුටුඹය ලෙසිනු යි
(පෙද විරිත)

97 දනාන්‍යෙවාපි සෙව්‍යඃ ස්‍යාත්
නිෂ්ඵලො න මහාන'පි
ජලාර්ථී වාරිදං ත්‍යක්ත්වා
පශ්‍ය කූපං නිෂෙවතෙ

(ශාර්ංගධර පද්ධති)

98 අපිනාම ස දෘශ්‍යෙත
පුරුෂාතිශ යො භුවි
ගර්වොච්ඡූන මුඛා යෙන
ධනිනො නාව ලොකිතාඃ

(සුභාෂිතාවලි)

99 පරිපූර්ණ ගුණාභොග
ගරිමොද්ගාර එව සඃ
ත්‍රිජගත් ස්පෘහනී යෙස්මින්
න රුචිර්ද්‍රවිණෙපි යත්

(සුභාෂිතාවලි)

100 කල්පස්ථායි න ජීවිත මෛශ්-
වර්‍ය්‍යං නාප්‍යතෙ ච යදභිමතම්
ලොකස්තථාප්‍යකාර්‍ය්‍යං
කුරුතෙ කාර්‍ය්‍යං කිමුද්දිශ්‍ය

(සුභාෂිතාවලි)

---

97 පවස – පිපාසය, ගනබක් – වලාකුලක්

**හීනයකු වුවත් දෙයි නම් ඔහු සෙවිය යුතු වේ.**

97 දෙන්නේද හීනයකු මුත් යුතුවේ සෙවීමෙක්
දීමෙක් නැතොත් සෙට වුවත් ඔහුගෙන් වැඩෙක් නෑ
ඕනෑ වුවොත් පවස නැස්මට පැන් පොදක්වත්
යන්නේද ළිං වෙත මිසක් ගනබක් වෙතේ හී

(වසන්තිලක වීරිත)

**ධනයේ මහත්වයෙන් ඉදිමුණු මුහුණු නොදකීම ම වංසනාවක් බව් පැවැසේ**

98 දනවත් දනගේ ලොබයෙන් පිරුණු
අහංකාරයෙන් ඉදිමුණු මුහුණු
කිනම් කෙනකු හෝ නැත්තෙද දක්කේ
උතුම් කෙනකු යයි පවසත හැක්කේ

(දෙපිය වීරිත)

**විෂය වස්තූන් කෙරෙහි ඇලීමක් නැත්තා පිරිපුන් මහාත්ම යෙකැයි යෙති.**

99 යමෙක් කෙසේ හෝ මුළුලෝ සියල්ලවුන්
ඉතාම ආසාවන වස්තු සම්පතේ
කිසිත් ඇලීමෙක් නැති ඒ ගුණෙන් සුපුන්
මහාත්මයෙක් මැය් මුළුතුන් තෙලේ උතුම්

(වසත් වීරිත

**සුළු කාලයක් ජිවත්වන මිනිසා ඉච්ඡා හංගත්වයෙන් දරුණුව අසුතු කරන්නේ ඇයිදැයි විමසුමෙකි.**

100 කපක් තරම් කල් දිගුවේද ජීවිත්
තමන් සිතුවක් නොලැබී ගියොත් යමෙක්
ඉදින් කරන්නේ බලවත් අයුක්තියක්
කිමෙක්ද මේවායෙ තිබේද තේරුමක් ?

(වසත් වීරිත)

101 අනුගන්තුං සතාං වර්ත්ම
කෘත්ස්නං යදි න සක්‍යතෙ
ස්වල්පමප්‍යනු ගන්තව්‍යං
මාර්ගස්ථො නාවසිදති

(ශාර්ංගධර පද්ධති)

102 ප්‍රත්‍යහං ප්‍රත්‍ය වෙක්ෂෙත
නරශ්චරිතමාත්මනඃ
කිංනු මෙ පශුභිස්තුල්‍යං
කිංනු සත්පුරුෂෛරිති

(ශාර්ංගධර පද්ධති)

103 සද්භිරෙව සහාසිත
සද්භිඃ කුර්විත සංගතිං
සද්භිර් විවාදං මෛත්‍රිංච
නාසාද්භිඃ කිංචිද වරෙත්

(ශාර්ංගධර පද්ධති)

104 ගතෙපි වයසි ග්‍රාස්‍යා
විද්‍යා සර්වාත්මනා බුධෛඃ
යද්‍යපි ස්‍යාන්න ඵලද
සුලභා සාන්‍ය ජන්මනි

(සුභාෂිතාවලි)

---

102 පිරිගා – පරික්ෂාකර

103 සැදිලි – සාකච්ඡා කිරීම.

**හුදිදන ගිය මාර්ගයෙහි ශක්ති පමණින් හෝ යා යුතුය.**

101 හුදි දන ගිය මගෙහි
මුළුමනින් යා නොහැකිද
හැකිතරමිනුදු යෑ යුතු
නොපිරිහෙ හේ කදහස

(ගී විරිත)

**තමන් වෙත ඇති ගති කුමන ගතිදැයි විමංශන බුද්ධියෙන් බැලිය යුතුය.**

102 සිය ගතිය තිරිසන්
ගතිද සුමිනිස් ගතිදැයි
මිනිසා විසින් නරතුරු
පිරිගා බැලිය යුතුවේ

(ගී විරිත)

**සත්පුරුෂයන් සමඟ ම සමාගම් පවත්වවු.**

103 සුදන හා එක්වවු
සසැදිලි සමාගම හා
මිතුරුදම් නිති පවතනු
දුදනන් නොගනු අහලට

(ගී විරිත)

**මහලු කලද විදු සතර උගත යුතු. මතු භවයෙහි හෝ ඉන් ඵල අත්වනු ඇත.**

104 මහලු වියෙහි දු විදු
සතර උගෙනුම් කළයුතු
මෙහිදි පල නොමලදහොත්
මතු බෙවෙහි පල අත්වේ

(ගී විරිත)

උපදෙශ ශතකයෙහි
**දෙවැනි තරංගය**
**නිමි.**

මේ පොත් පෙළට කරුණු උපුටාගත් පොත්වල නාම මාලාව හා හැඳින්වීම මුල් පොතෙහි පළ විය.

උපදෙශ ශතකය 1
උපදෙශ ශතකය 3
පළවී ඇත



